**(හැඳින්වීම)**

සාමාන්‍ය සමයේ තිස්දෙවන ඉරුදින වන අද දින පළමු දේව ප්‍රකාශනය මගින් එළියා දිවැසිවරතුමන් සහ ශාරෙපත්හි වැන්දඹු ස්ත්‍රීය පිළිබඳව කථාන්තරය අපට ඉදිරිපත් කරයි. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ දෙනෙකුගේ පව් දුරු කරන පිණිස එකම එක් වරක් දිවි පිදූ බවත් උන්වහන්සේගේ ආගමනය බලා සිටින්නන්ට ගැළවීම දෙන පිණිස, උන්වහන්සේ දෙවන වර ප්‍රකාශ වන බවත් දෙවන දේව ප්‍රකාශනය තුළින් සිහිපත් කර දෙයි. එසේම දිවිපෙවෙත සඳහා තිබූ මුළු වත්කම ම දෙවි පියාණන් වහන්සේට පඬුරක් ලෙස ඔප්පු කළ වැන්දඹු ස්ත්‍රීයකගේ බැහැපත් ක්‍රියාව පිළිබඳව සුපුවත තුළින් විස්තරවේ.

අප සැම ද මෙලොව ජීවිතය පුරා දෙවි පියාණන් වහන්සේට විශ්වාස පක්ෂ වෙමින්, උන්වහන්සේ වෙතින් අප ලද සියල්ල දේව මහිමය උදෙසා යොදවන්නට ද, ත්‍යාගශීලී දිවියක් ගත කරමින් නිරන්තරයෙන් දෙව් සරණය තුළ යැපෙන්නට ද, අවැසි වරම් ඉල්ලා මෙම ශුද්ධ වූ යාගයට භක්තියෙන් සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර: ස්වාමිනී , අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී, ඔබවහන්සේගේ කැඳවීමට අවනත වෙමින්, පූජා වීමේ දිවි පෙවෙතකට ඇතුළු වූ සුදතුම් පියතුමන් ඇතුළු පූජක සහ පැවිදි සැම නිරන්තරයෙන් සුදත් සුරිඳු වරමින් බලවත් කර, මග පෙන්වන පිණිස,

2) ආදර දෙවි පියාණනී, අප සතු සියල්ල ම ඔබවහන්සේ වෙතින් ලද බව සිහිකරමින්, අප ජීවිත දේව මහිමය උදෙසා ම වැය කරන්නට සහ අචල ඇදහිල්ලෙන් යුතුව දේව රාජ්‍යය තුළ දිවි ගෙවන්නට අප මීසම් පවුලේ සැමට මග පෙන්වන පිණිස,

3) ආදර දෙවි පියාණනී, ලෞකික සැප සම්පත් , බලය සහ ගෞරවය සොයනවා වෙනුවට අප ජීවිත තුළ ස්වර්ගීය වටිනාකම් ගොඩනගා ගන්නට ද, අප සහෝදරයන්ගේ අවැසිතා හඳුනාගෙන ඔවුනට සහනයක් වන්නට ද අවැසි ත්‍යාගශීලී සිතක් අප වෙත දානය කරන පිණිස,

4) ආදර දෙවි පියාණනී, ගෞරවය හෝ සේවය ලැබීම පිණිස නොව, දේශයේ සුබසෙත හා යහපත ගොඩනගන පිණිස කැපවන්නට අප රට පාලකයින්ට අවැසි නිසි මගපෙන්වීම නොඅඩුව දානය කරන පිණිස,